**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, ශිර්ෂය 275 දරන පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශිර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 02 දින *දිස්ත්‍රික් ලේකම්වරයා* වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්ය සාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

-----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.21 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හා 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128 (1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| -------------------------------- | | ---------------------------------- | -------------- |
| මුදල් රෙගුලාසි<br>------------------ | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම. | 2.3.1 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.11 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.15 |
| | | 4. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.3.2(ඇ) |
| | | 5. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම | 2.3.2(ඇ) |
| | | 6. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.3.2(ඉ)<br>2.4 |
| | | 7. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.5(අ) |
| | | 8. වත්කම්වල වටිනාකම හා ගුණාත්මකභාවය අඩුවීම | 2.8 |
| | | 9. අනාර්ථික ගනුදෙනු | |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු | මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු | 2.10 |

| | | | |
|---|---|---|---|
| | කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | |
| 128(1)(ඈ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>2. අනුකූල නොවීම් | 2.15<br>2.16 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.12 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු<br>2. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.5(ඉ)<br>2.5 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු. | 2.13 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඍ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීම | 2.12(අ),(ආ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව,විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම | 2.3.2(ඇ) |
| | | 2. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම | 2.3.2(ඈ) |
| | | 3. කාල පමාවකින් පසු වැඩ ආරම්භ කළ ව්‍යාපෘති | 2.3.2(ඊ) |
| | | 4. අනාර්ථික ගනුදෙනු | 2.8 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳි සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.6 |
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු | 2.20 |
| 128(1)(ඡ) | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් /සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | 1. පිරිවැය හා කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය කිරීම | 2.5(ඇ) |
| | | 2. පාඩු හා හානි | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්

(අ) ව්‍යවස්ථාපිත අණපනත් මගින් පැවරී ඇති බලතල හා වගකීම් ඉටු කිරීම .

(ආ) රජයේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් හා සංවර්ධන ව්‍යාපෘති (සමෘද්ධි හා විමධ්‍යගත වැඩ සටහන්) රජයේ නියමයන්, උපදෙස් හා මඟපෙන්වීම් වලට අනුකූල වන පරිදි ක්‍රියාවට නැංවීම සහතික කිරීම.

(ඇ) දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන මඟින් ජනතා අභිවෘද්ධිය සඳහා ඉටු කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා පරිපාලන කටයුතු යථාවත් පරිදි ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සමායෝජනය, සම්බන්ධීකරණය හා මඟපෙන්වීම.

(ඈ) ආණ්ඩුවේ දිස්ත්‍රික් නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

(ඉ) ස්වාභාවික හා වෙනත් ව්‍යසන හා ආපදා, දිස්ත්‍රික්කය තුළ ඇති වූ අවස්ථාවලදී ප්‍රායෝගිකව මැදිහත් වී කටයුතු කිරීම.

### 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමඟින් ඉටු කළ යුතු කාර්යභාරයයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමඟින් ඉටු කළ යුතු කාර්යභාරයයන් පහත දැක්වේ.

| | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන | ස්ථාපිත කිරීම් අධිකාරී බලය | කාර්යභාරය |
|---|---|---|---|
| (i) | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1992 අංක 58 දරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමේ පනත | මධ්‍යම රජයේ සහ පළාත් සභාවලින් පවරනු ලබන පරිපාලන හා සංවර්ධන කාර්යභාරයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම |
| (ii) | ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| (iii) | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| (iv) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| (v) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| (vi) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| (vii) | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |

### 2.3 කාර්යසාධනය

#### 2.3.1 සැලසුම් කිරීම

**ක්‍රියාකාරී සැලැස්ම**

ශීර්ෂ 275 දරන පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදනවලට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර තිබුණු නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් ලැබී තිබුණු රු. මිලියන 1,664 ක ප්‍රතිපාදනයන්ට අදාළ ක්‍රියාකාරකම් එම සැලැස්මේ ඇතුලත්ව නොතිබුණි.

**2.3.2 කාර්යභාරයන් ඉටු නොකිරිම**

---

**(අ) කාර්යභාරයන් පිළිබඳ දැනුවත් නොවීම**

---

පළාත් සභාවක යම් ප්‍රඥප්තියකින් තමාට පවරන ලද හෝ වෙන්කරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් හෝ පළාතක ආණ්ඩුකාරවරයා විසින් තමා වෙත පවරා දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් තම පත්කිරීමේ නිළධාරියාගේ එකඟත්වය ඇතිව කොට්ඨාශය තුළ ඉටුකළ යුතු වුවත් මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් වී නොතිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

---

සමාලෝචිත වර්ෂයේ නියැදි විගණන පරීක්ෂාවන් මත නිරීක්ෂණය වූ ඉටු නොකරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

(i) වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ව්‍යාපෘති 485 ක් හඳුනාගෙන තිබුණද, 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණේ එයින් ව්‍යාපෘති 72 ක් පමණි.

(ii) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂය සඳහා රු. 568,750,000 ක සැලැසුම් සකස් කර තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘතිවල වටිනාකම රු. 78,943,770 ක් විය. එනම් සැලසුම් කරන ලද ව්‍යාපෘති වටිනාකමින් සියයට 14 කට පමණක් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

(iii) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු. 2 ,670,000 ක් වු ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගිරිතලේගම පුරාණගම පන්සල පිටුපස දෙවැට පාර රු. 500,000 ක් වැයකර ඉදිකර තිබුණි. එසේ වුවද එම මාර්ගයේ බයිසිකල් හා ත්‍රීරෝද රථ හැර අනෙකුත් වාහන ධාවනය කිරීම සඳහා පාරට ඇතුළු කළ නොහැකිව පැවතුණි.

(ii) ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කමත් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2017 යටතේ රු. 1,044,622 ක පමණ වටිනාකමකින් ඉදිකර තිබුණු හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කටුකැලියාව නිග්‍රෝධාරාම විහාරස්ථානයේ කමතෙහි මැද කොටස මීටර් 14 ක පමණ දිගකින් සම්පූර්ණයෙන් පුපුරා තිබුණි.

(iii) තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යාය 13 සමඟි අවමංගල්‍යාධාර සමිතියේ තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.495,000 ක් ලබා දී තිබුණද, එහි තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ඉදිකර නොතිබුණි.

(iv) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ රු. 1,361,397 ක ප්‍රතිපාදන මත ඉදිකර තිබුණු මාරසිංහවත්තේ කාණු පද්ධතියේ ඇතැම් ස්ථාන පුපුරා තිබුණු අතර එහි පැතිබැම්ම ඇස්තමේන්තුවේ සඳහන් පිරිවිතර ප්‍රකාරව සකසා නොතිබුණි.

**(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

**-----------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016/2018 යටතේ ක්‍රියාත්මක අතිරේක ආහාර බෝග ප්‍රවර්ධන වැඩසටහන යටතේ ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොවීන්ට බෙදා දීමට මිලදීගත් රු. 11,000,000 ක් වටිනා බඩ ඉරිඟු බීජ කිලෝ 10,000 න් බකමූණ ගොවිජන සේවා කාරක සභාව වෙත ලබා දී තිබුණු කිලෝ ප්‍රමාණය 9,500 ක් වූ අතර එයින් බෙදාදී තිබූ බඩ ඉරිඟු බීජ ප්‍රමාණය කිලෝග්‍රෑම් 4,910ක් පමණක් විය.

(ii) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන 2016 යටතේ අත්කම් භාණ්ඩ නිෂ්පාදන මධ්‍යස්ථානයක් ලෙස 285 මුතුවැල්ල ග්‍රාම නිලධාරී කාර්යාල ගොඩනැගිල්ල රු. 1,007,784 ක වියදමින් සංවර්ධනය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එය අත්කම් භාණ්ඩ නිෂ්පාදන කාර්ය සඳහා යොදා ගෙන නොතිබුණි.

(iii) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නව නගරය සති පොල 2016 දෙසැම්බර් 20 දින ඉදිකිරීම් අවසන් කර තිබුණ ද 2017 දෙසැම්බර් 29 දින වන විටත් විවෘත කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

**--------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අත්හැර තිබුණි.

(i) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ මැටි වලං හා විසිතුරු භාණ්ඩ නිෂ්පාදන කම්හල ඉදිකිරීම සඳහා රු. 882,000 ක මුදලක් වැයකර 2016 වර්ෂයේ ඉදිකිරීම් නිමකර තිබුණ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය ආරම්භ නොකර ගොඩනැගිල්ල අත්හැර දමා තිබුණි.

(ii) රජරට නවෝදය වැඩසටහන යටතේ ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2013 හා 2015 වර්ෂවල රු. 1,685,600 ක් වැය කර කොහු ආශ්‍රිත නිෂ්පාදන කම්හලක් ඉදිකර තිබුණද 2017 නොවැම්බර් 09 දින වන විටත් කිසිදු නිෂ්පාදන කටයුත්තක් ආරම්භ කර නොතිබුණි.

(iii) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2017 වර්ෂයේ වටිනාකම රු. 415,000 ක් වූ විමධ්‍යගත ව්‍යාපෘති 2 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) 2016 විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පේෂ කර්මාන්ත ශාලාවක් ඉදිකිරීමට රු. 600,000 ක් වැයකර තිබුණද නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි.

**(ඊ) කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

**-------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2017 වර්ෂයේදී ග්‍රාමීය යටිතල පහසුකම් ව්‍යාපෘතිය යටතේ පුලස්තිගම මහජන ප්‍රේක්ෂකාගාරයේ සංවර්ධන කටයුතු සඳහා රු. 1,000,000 ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණ ද 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් අතිරේක බෝග ප්‍රවර්ධන වැඩසටහන යටතේ මිලදී ගෙන තිබුණු රු. 10,890,000 ක් වටිනා බඩ ඉරිඟු බීජ කිලෝග්‍රෑම් 9,000 කින් 2018 පෙබරවාරි 22 දින වන විටත් රු. 9,014,500 ක් වටිනා බීජ කිලෝග්‍රෑම් 7,450 ක් බෙදා නොහැර දිඹුලාගල සමුපකාර සමිති ගබඩාවේ රඳවාගෙන තිබුණි.

## 2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

**------------------------------------------------------------**

මිල ගණන් කැඳවීමේ උපලේඛනයට හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තා අනුව මිල ගණන් කැඳවා නොමැති ආයතනයකට පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, අන්තර්බන්ධිත ගල් මිලදී ගැනීමට ලන්සු පිරිනමා සැපයුම් සඳහා රු. 5,442,301 ක් ගෙවා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

**--------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

**-------------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන ගාල්කර තැබීම සඳහා ආරක්ෂිත ආවරණ සහිත ගරාජයක් නොතිබීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු නවීන වර්ගයේ ට්‍රැක්ටර් රථය සහිත බවුසර් 10 ක් ස්වභාවික ආපදාවන්ට ලක්වෙමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ii) කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යංශය මඟින් ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇඟළුම් කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා ලබාදී තිබුණු ජුකී මැෂින් 25 ක් අනාරක්ෂිත ලෙස ගබඩා කර තිබුණි.

(ආ) **වාහන උපයෝජනය**

**-----------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

**---------------------------------------**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සෑම වාහනයකම ඉන්ධන දැවීම පරීක්ෂාව මාස 12 කට වරක් හෝ කි.මී 25,000 දුර ධාවනය කිරීමෙන් පසු හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකින් පසු යන කාරණාවලින් මුලින්ම යෙදෙන අවස්ථාවේ කළ යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 15 ක හා වැලිකන්ද හා තමන්කඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතු වාහනවල ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි.

(ඇ) **පිරිවැය හා කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය කිරීම**

**----------------------------------------------------------------------**

තමන්කඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ අයිතම 364 ක් 2017 මැයි 31 දින පවත්වන ලද භාණ්ඩ වෙන්දේසිය මගින් අලෙවි නොවීම හේතුවෙන් විගණිත දින වූ 2017 නොවැම්බර් 29 දින වන විටත් ගබඩාවේ ගොඩ ගසා තිබුණි.

(ඈ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**---------------------------------------**

(i) පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

| **වත්කම් වර්ගය** | **ඒකක ගණන** | **නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය** | |
|---|---|---|---|
| | | **වර්ෂ 03ට අඩු** | **වර්ෂ 03ට වැඩි** |
| වාහන | 05 | 04 | 01 |
| රජයේ නිවාස | 01 | - | 01 |
| ජල බවුසර් | 02 | 02 | - |
| පරිගණක හා උපාංග | 8 | 8 | - |
| e-NIC වැඩසටහනට මිල දී ගත් උපකරණ | 223 | 223 | - |

(ii) තමන්කඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා විවිධ වැඩසටහන් යටතේ ලැබී ඇති හා මිලදී ගෙන තිබුණු රු. 2,075,018 ක් වටිනා භාණ්ඩ අයිතම 67 ක් විගණිත දින වන විටත් අදාළ පාර්ශවයන් වෙත බෙදා නොහැර ගබඩාව තුළ රඳවා තිබුණි.

(iii) පොළොන්නරුව ධවල මන්දිරය රංග ශාලාවේ පැවති රු. 391,092 ක් වටිනා පුටු රංග ශාලාවේ ශබ්ද ධ්වනි පද්ධති සවිකිරීමේදී සැලසුම්වල සහ පාලන මැදිරි සකස් කිරීමේදී සිදුවූ වෙනස්කම් හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි.

(iv) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සාමාන්‍ය වාර්ෂික අවශ්‍යතාවය වූ ස්ටිකර් 2,000 ඉක්මවා වසර 87 කට පමණ ප්‍රමාණවත් QR (Quick Reader) ස්ටිකර්ස් 175,650 ගබඩාකර තිබූ අතර එය වසර කිහිපයකින් විනාශ වීමේ අවදානමක් පැවතුණි.

(v) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිංගර් මහන මැෂින් 04 ක් හා ප්ලාස්ටික් පුටු 137 ක් ප්‍රතිලාභීන් වෙත බෙදාහැරීමෙන් තොරව ගබඩාවේ ගොඩගසා තිබුණි.

(vi) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ රු. 10,849,152 ක් වැය කර සේවා පියසවල් 7 ක් ඉදිකර තිබූ නමුත් ජල හා විදුලි පහසුකම් නොමැති වීම මත වර්ෂයකට අධික කාලයක් එම ගොඩනැඟිලි නිෂ්කාර්යව පැවතුණි.

**(ඉ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තාව 2018 මාර්තු 19 දින වන විටත් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 බැදීම් හා බැරකම්

සමාලෝචිත වර්ෂයේ තමන්කඩුව, ඇලහැර, වැලිකන්ද, මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ රු. 233,604 ක බැරකම් ලේඛනගත කර නොතිබුණ අතර විසර්ජන ගිණුමේද හෙළිදරව් කර නොතිබුණි.

## 2.7 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල නිවාසයක පදිංචිව සිටි නිලධාරියෙකුගෙන් රු. 210,098 ක් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණු හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් සතු රජයේ නිල නිවසින් රු.23,688 ක් වශයෙන් නිවාස කුලී හා මහවැලි සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත ලබා දී තිබුණු නිවාසයෙන් 2016 සිට මේ දක්වා හිඟ කුලිය හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වකුගඩු ආධාරලාභීන් 04 දෙනෙකු වෙත ඉල්ලුම්පත් දෙක බැගින් ලබාදී ආධාර මුදල් රු. 222,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලොරි බවුසර් රථයක් හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථයක් අනතුරකට ලක්වීම නිසා රු. 892,813 ක හානියක් සිදු වී තිබූ නමුත් මු.රෙ. 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි.

(ඇ) රජරට නවෝදය - 2016 වැඩසටහන යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ජල ව්‍යාපෘති ඉදිකිරීමට ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය වෙත සමාලෝචිත වර්ෂයේ රු. 3,399,782 ක් ගෙවීම් කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය විසින්ද මෙම ව්‍යාපෘති ඉටුකිරීමට සැලසුම් කර ඇති බැවින් ගෙවන ලද මුදල් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ආපසු ගෙවීමට කටයුතු කරන බවට ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය විසින් සඳහන් කර තිබුණි. මෙම ව්‍යාපෘති 2017 ඔක්තෝබර් 20 වන විටත් ආරම්භකර නොතිබුණු අතර මුදල් ආපසු ලබාගෙනද නොතිබුණි.

(ඉ) තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බදුකරුවන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ඉඩම් බදු ආදායම රු.758,658 ක් විය.

## 2.8 අනාර්ථික ගනුදෙනු

---------------------

වකුගඩු රෝහලේ මුල්ගල තැබීමේ උත්සවය සඳහා ජනතාව ප්‍රවාහනයට රු. 757,500 ක්, කෙටි ආහාර පාර්සල් සඳහා රු. 250,000 ක් හා නර්තන කණ්ඩායම් සඳහා රු. 75,000 ක් වශයෙන් වියදම් දරා තිබුණි.

## 2.9 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ක්‍රියාත්මක කරනු ලබන විදාතා සම්පත් මධ්‍යස්ථාන වැලිකන්ද හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ස්ථාපිත කර නොතිබුණි.

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 316.81 ක් පමණ අනවසර පදිංචිකරුවන් විසින් අල්ලාගෙන ඇති බව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවට අනාවරණය වී තිබුණ ද සැලසුම් සහගතව මෙම ඉඩම් උපයෝජනය කිරීමට අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාර්ශවයන් 02 ක් විසින් වලංගු කැණීම් බලපත්‍රයක් නොමැතිව ද, තවත් පාර්ශවයක් විසින් පරිසර බලපත්‍රය නොමැතිව ද කළුගල් කැණීම් සිදු කරමින් පැවතුණි.

(ඈ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජයේ ඉඩමක පවත්වාගෙන යනු ලබන කළුගල් කැඩීමේ ස්ථානයෙන් ඉඩම් බලපත්‍ර සඳහා වන බදු මුදල් හා භූ විද්‍යා හා පතල් කැණීමේ කාර්යාංශයේ කැණීම් ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ඉ) තමන්කඩුව ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශය විසින් ඉ.කො. 157 ලේඛනයක් නඩත්තු කර නොතිබුණු අතර මූලික අවසන් තේරීම් ලැයිස්තු පමණක් පවත්වාගෙන ගොස් තිබුණි. ඉඩම් ලෙජර වැඩි ප්‍රමාණයක් තුළ පසු උරුමය නම් කර නොතිබුණි

(ඊ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිවිනැගුම බැංකු සංගම් දෙකෙහි ගිණුම් තොරතුරු අනුව 2017 සැප්තැම්බර් 30 දිනට ගිණුම් 94 ක රු. 4,642, 094 ක ණය ආපසු ගෙවීම් මාස 9 කට අධික කාලයක සිට පැහැර හැර තිබුණු අතර එම ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානය යොමු කර නොතිබුණි.

(උ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිවිනැගුම බැංකු සංගම් දෙකෙහි 2017 සැප්තැම්බර් 30 දිනට ගිණුම් 3293 ක රු. 2,515,202 ක ශේෂයන් වසර 03 කට අධික කාලයක සිට අක්‍රියව පවතින බව නිරීක්ෂණය වූ අතර, ඒවා සක්‍රීය තත්ත්වයට ගෙන ඒමට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ඌ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල නිවසක වසර 30 කට ආසන්න කාලයක සිට පදිංචි නිලධාරියෙකු 2016 අප්‍රේල් 27 දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් ඇතත් විගණන දිනය වූ 2018 පෙබරවාරි 28 වන විටත් එම නිවස භාරදීමට කටයුතු කර නොතිබුණි.

(එ) පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2 අදියරේ දෙවන බිල්පත ගෙවීමේ දී ගණනය කර තිබූ වැඩ බිමේ ඇති අමුද්‍රව්‍ය වටිනාකම, දිස්ත්‍රික් මිල කමිටු වාර්තාවේ ඇතුළත් මිල ගණන් සමඟ සැසඳීමේ දී රු. 718,750 ක අහිතකර මිල විචලනයක් පැවතුණි.

(ඒ) 1969 අංක 7 දරණ රජයේ නිවාස (සන්තකය ආපසු ගැනීමේ) පනතේ 3 වගන්තිය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කදුරුවෙල මාණ්ඩලික නිල නිවාසයේ පදිංචි ජාතික ශිෂ්‍ය භට බලකායේ නිලධාරියාට අස්කිරීමේ නිවේදනයක් නිකුත් කර ඇතත් 2018 පෙබරවාරි 15 විගණිත දින වන විටත් නිවස භාරදීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ඉදිරි පියවරක් ගෙන නොතිබුණි.

**2.10 මහජනයා වෙත සේවා ඉටු කිරීම.**

-----------------------------------

මහජනයා වෙත ඉටුකළ යුතුව තිබුණු සේවා ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලද 2017 නොවැම්බර් 2 හා අංක NCP/EH/E/1/RIT/9 දරණ තොරතුරු ඉල්ලීමේ අයදුම්පතට අදාළ තොරතුරු 2018 මාර්තු 12 දින වන විටත් යැවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා විශ්‍රාම වැටුප් විෂයයට අදාළව ලිපිගොනු 2,396 ක් පවතින අතර විෂයය රාජකාරී සඳහා එක් නිලධාරීයෙකු පමණක් පත්කර තිබූ බැවින් විශ්‍රාමිකයන් සඳහා වඩා හොඳ සේවාවක් ලබාදීමේදී ගැටළු තත්ත්වයක් පැවතුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශයේ රාජකාරී ඉටුකර ගැනීම සඳහා පැමිණෙන ආබාධිත හා වයෝවෘද්ධ පුද්ගලයින් සඳහා තම රාජකාරී ඉටුකර ගැනීමට පහසු වන පරිදි ඉඩම් අංශයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත්ව නොතිබුණි.

(ඈ) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2017 නොවැම්බර් 01 වන විට ඉදිරිපත් කර තිබූ ඉල්ලුම්පත්‍ර ගණන 1,263 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණු බලපත්‍ර ගණන 44 ක් විය. එසේම පවත්වා තිබූ ඉඩම් කච්චේරි ගණන 01 ක් විය.

(ඉ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කළු ගල් කැණීම් ස්ථානයකින් ප්‍රදේශයේ ජනතාවට සිදුවන හිරිහැර හා පාරිසරික හානිය පිළිබඳව 2001 වර්ෂයේ සිට වරින් වර මහජනතාව පැමිණිලි කර ඇතත් පාලනයක් සිදුවී නොතිබුණි. ප්‍රාදේශීය ලේකම්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා හා විගණනයේ දී සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ අනුව මෙම ස්ථාන සඳහා පාරිසරික බලපත්‍ර ලබාදීමේ හැකියාවක් නොපවතින නමුත් ප්‍රාදේශීය පරිසර නිලධාරී විසින් 2017 නොවැම්බර් 15 හා 2017 දෙසැම්බර් 08 යන දිනයන්වලදී සාවද්‍ය දත්ත ඇතුළත් කර පාරිසරික

බලපත්‍ර ලබාදී තිබුණි. පරිසරයේ පැවැත්මට තර්ජනයක් වන ආකාරයට සාවද්‍ය වාර්තා සකස් කළ මෙම නිලධාරියා සම්බන්ධව ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් කට්ටිකරුවන් 828 ක් වෙනුවෙන් 2015 වර්ෂයේ පවත්වා තිබුණු ඉඩම් කච්චේරි අවලංගු කර තිබුණද 2018 මාර්තු 12 විගණිත දින දක්වාම එම ඉඩම් කට්ටිකරුවන්ගෙන් සුදුසු පුද්ගලයින් හඳුනාගෙන බලපත්‍ර ලබා දී නොතිබුණි.

## 2.11 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ ***දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට*** සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 273.61 | 260.46 | 13.15 | 4.8 |
| | මූලධන | 406.75 | 403.55 | 3.20 | 0.8 |
| | **එකතුව** | **680.36** | **664.01** | **16.35** | **2.4** |
| 2014 | පුනරාවර්තන | 367.36 | 357.47 | 9.89 | 2.7 |
| | මූලධන | 85.90 | 85.11 | 0.79 | 0.9 |
| | **එකතුව** | **453.26** | **442.58** | **10.67** | **2.4** |
| 2015 | පුනරාවර්තන | 351.50 | 340.53 | 10.97 | **3.1** |
| | මූලධන | 604.20 | 228.46 | 375.74 | 62.2 |
| | **එකතුව** | **955.70** | **568.99** | **386.71** | **40.5** |
| 2016 | පුනරාවර්තන | 369.80 | 363.81 | 5.98 | 1.6 |
| | මූලධන | 5,693.94 | 3,512.33 | 2,181.61 | 38.3 |
| | **එකතුව** | **6,063.74** | **3,876.14** | **2,187.60** | **36.1** |
| 2017 | පුනරාවර්තන | 416.27 | 415.27 | 0.99 | 0.2 |
| | මූලධන | 522.00 | 430.96 | 91.04 | 17.4 |
| | **එකතුව** | **938.27** | **846.24** | **92.03** | **9.8** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ කාර්යභාරයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තුව තාත්ත්වික ලෙස පිළියෙල කර නොතිබීම නිසා පහත සඳහන් ඌනතාවය සිදු වී තිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ වෙන්කළ රු. මිලියන 500 ක මුදල නියමිත කාලය තුළ උපයෝජනය කිරීමට නොහැකිවීම නිසා රු. මිලියන 17.12 ක ප්‍රතිපාදන මුදලක් ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අවශ්‍ය ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදීගැනීම සඳහා මාරුකර තිබුණි.

**2.12 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂයය අංක 27501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 31.00 | 30.97 | 21.00 | 22.76 | 120.00 | 91.67 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

(i) පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා වැලිකන්ද, ලංකාපුර, ඇලහැර හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් හයදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු. 933,145 ක් වූ අතර එම ශේෂයෙන් රු. 448,247 ක් 2018 ජූනි 30 වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.

(ii) ලංකාපුර, ඇලහැර හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩ තහනම් කර තිබුණු නිලධාරීන් තිදෙනෙකුගේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ තමන්කඩුව, දිඹුලාගල හා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය අතහැර ගොස් සිටි නිලධාරීන් 06 දෙනෙකුට අදාළ ණය ශේෂ පිළිවෙලින් රු. 1,164,963 ක් හා රු. 363,150ක මුදලක් වර්ෂ 01 ත් 16 ත් අතර කාල පරාසයක් තුළ අයනොවී පැවතුණි.

**(ආ) හඳුනා නොගත් හර ශේෂයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ හඳුනා නොගත් හර ලෙස දක්වා තිබූ ශේෂය රු. 487,518 ක් විය.

**2.13 අග්‍රිම ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන සඳහා ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම නිසා වර්ෂය අවසාන වන විට රු. මිලියන 2,568 ක අතැති බිල්පත් දක්නට තිබුණි.

(ආ) 2015 ජූලි 14 දිනැති 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්ය නිමකර දින 10 ක් ඇතුලත අතුරු අග්‍රිම නිරවුල් කළයුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඇලහැර, හිඟුරක්ගොඩ, මැදිරිගිරිය, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 35 කදී ලබාදී තිබුණු එකතුව රු. 758,750 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්ය නිම වී දින 16 සිට මාස 03 ක් පමණ කාල ප්‍රමාදයෙන් යුතුව නිරවුල් කර තිබුණි.

## 2.14 පොදු තැන්පත් ගිණුම

-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 7 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 440.36 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දින වන විට පොදු තැන්පත් ගිණුම් 02 කට අදාළව වර්ෂ 02 ක කාලය ඉක්මවූ රු.මිලියන 4.07 ක් වටිනා තැන්පතු 67 ක් සම්බන්ධව මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 ඔක්තෝබර් සිට 2017 ජනවාරි දක්වා කාලය තුළ නොගෙවූ වකුගඩු දීමනා රු. 75,000 ක් හා 2015 දෙසැම්බර් 15 දින බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් දහම් පාසල් ගුරු දීමනා ගෙවීම සඳහා එවන ලද රු. 141,400 ක මුදල අදාළ කාර්යයේ නොයොදවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන 2017 දෙසැම්බර් මස ආයතන වෙත ආපසු යවා තිබුණි.

(ඇ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයට අදාළව ලබා නොගත් වැඩිහිටි දීමනා රු. 76,000 ක් හා නියගයෙන් අවතැන් වූ අයට ජලය ලබාදීම සඳහා හෙල්පින් ශ්‍රී ලංකා වෙතින් 2017 ජූනි 19 ලද රු. 75,000 ක් අදාළ කාර්යයට යොදා නොගෙන පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.15 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ලංකාපුර, හිඟුරක්ගොඩ, වැලිකන්ද යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දිඹුලාගල, ඇලහැර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සුළු මුදල් පොත | මු.රෙ. 446 | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මු.රෙ. 454(2) | හිඟුරක්ගොඩ, මැදිරිගිරිය, ඇලහැර, දිඹුලාගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ඉ) | හානි පිළිබඳ ලේඛනය | මු.රෙ. 110 | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ඊ) | බැරකම් පිළිබඳ ලේඛනය | මු.රෙ. 214 | තමන්කඩුව, හිඟුරක්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් යාවත්කාලීන කර නොතිබුණි. |
| (උ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මු.රෙ. 341 | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඌ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මු.රෙ. 1647(ඉ) | හිඟුරක්ගොඩ, මැදිරිගිරිය, දිඹුලාගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (එ) | ප්‍රසම්පාදන කමිටුවල හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ඒ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ඔ) | රාජකාරි දුරකථන ලේඛනය | මු.රෙ. 845(1) | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |

**2.16 අනුකූල නොවීම්**

**2.16.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| | 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ 9 (ඇ) වගන්තිය | - | සෑම අවුරුද්දකම යටත් පිරිසයින් එක් වරක්වත් නියමිත ආකාරයට ලියාපදිංචි වී ඇති ස්වේච්ඡා සංවිධානවල ගිණුම් විගණනය කිරීමට සැලැස්වීම කළ යුතු වුවද හිඟුරක්ගොඩ, ඇලහැර, වැලිකන්ද යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල එවැනි අධික්ෂණයක් සිදුවී නොතිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මු.රෙ 237 | 1,014,340 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන තිබූ භාණ්ඩ තොග ලේඛන ගතකළ බවට සහතිකයක් ගෙවීම් වවුචර් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මු.රෙ 1642 | - | හදිසි අනතුරු සම්බන්ධ එදිනම පොලීසියට දැනුම්දිය යුතු බව දක්වා ඇතත්, වැලිකන්ද ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වාහනයකට සිදුවූ අනතුර දින 09 ක් ප්‍රමාද කර පොලීසියට දැනුම් දී තිබුණි. |
| (ඇ) | **ජාතික අයවැය චක්‍රලේඛ** | | |
| | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 ජනවාරි 31 දිනැති අංක MNPEF.NCD/AG/MIS/Paddy ලිපිය | - | වී තොග පිළිබඳව පරිගණක දත්ත පද්ධතියක් පවත්වාගෙන යන ලෙස දන්වා තිබුණද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එවැනි පරිගණක තොරතුරු පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ 2015 අප්‍රේල් 16 දිනැති සුරාබදු නිවේදන 902 හි 13(ඌ) උප වගන්තිය අනුව කටයුතු කිරීම සඳහා වූ අංක 20/197/27/02359 දරන ලිපිය | - | පාසල් හා ප්‍රසිද්ධ පූජනීය ස්ථානවලට තිබිය යුතු නිශ්චිත දුර ප්‍රමාණය නොමැති බවට වාර්තා වී තිබුණු ආයතන 03 ක් සඳහා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සුරාබදු බලපත්‍ර ලබාදී තිබුණි. |
| (ඉ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ | | |
| (i) | 1.3.3 (ඊ) ඡේදය | - | මූලික තෝරා ගැනීම් ලේඛනය දින 14 ක් තුළ විරෝධතා සඳහා ප්‍රසිද්ධියට පත්කොට විරෝධතා ලබාගත යුතු වුවද, 2017 වර්ෂය සඳහා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශය විසින් නියමිත කාලය ඉකුත් වී දින 13 ත් දින 106 ත් අතර කාල ප්‍රමාදයකින් යුතුව මූලික තේරීම් ලැයිස්තුව විරෝධතා සඳහා ප්‍රසිද්ධ කර තිබුණි. |
| (ii) | 1.3.3 (ඊ) ඡේදය | - | මූලික තේරීම් ලේඛනය සඳහා විරෝධතා ලබා ගැනීමට ලබා දුන් දින 14 ට පසුව එළැඹෙන දින 14 තුළ මූලික විරෝධතා නිරීක්ෂණය අවසන් කර අවසන් ලේඛන සකස් කොට ප්‍රසිද්ධ කළ යුතු වුවත් මූලික විරෝධතා නිරීක්ෂණ අවසන් කළ යුතු දින 14 ඉක්මවා අවසන් ලේඛනය සකස් කිරීමට දින 61 ත් දින 129 ත් අතර කාල පරාසයක් ගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| **2.16.2** | **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**<br>----------------------------------<br>2015 අංක 05 දරන දේශීය ආදායම් පනතේ 115 වගන්තිය | සියලුම සේවායෝජකයින් විසින් මාසික දළ වැටුප රු. 62,500 හෝ වාර්ෂිකව රු. 750,000 ඉක්මවන සේවාදායකින්ගේ වැටුප් ගෙවන අවස්ථාවේදී උපයන විට ගෙවීම් බද්ද අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එලෙස කටයුතු කර නොතිබුණි. |

**2.17 අභ්‍යන්තර විගණනය**

-------------------------

ගණන්දීමේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තුවල මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරි හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතුව බව මුදල් රෙගුලාසි 133 මඟින් අවධාරණය කර ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී මුදල් කටයුතුවලට අදාළව පිළියෙල කර තිබුණු අභ්‍යන්තර විගණන වැඩසටහන තුළ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණනයක් ඇතුළත් කර නොතිබීම නිසා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් පරීක්ෂා කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක සිදුකර තිබූ අභ්‍යන්තර විගණනයට අදාළ වාර්තාවල පිටපත් 10 ක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.18 විගණන හා කළමනාකරණ කමිටුව

-----------------------------------

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට කාර්තුවකට එක බැගින් රැස්වීම් වාර 04 ක් පවත්වා එමඟින් ගනු ලැබූ තීරණ, ගනන්දීමේ නිලධාරී විසින් ආයතනය තුළ ක්‍රියාත්මක කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය තුළ පවත්වනු ලැබූ රැස්වීම් වාර 03 හි ගනු ලැබූ තිරණවලින් සමහර තීරණ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.19 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

### 2.19.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

------------------------------------------------------------------------------------------

ඉහත 2.1 හා 2.2 ඡේදවල සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 312.1 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 377,444 ක් වී තිබුණි.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 35 | 6 |
| තෘතීයික මට්ටම | 22 | 8 | 14 |
| ද්විතීයික මට්ටම | 979 | 702 | 277 |
| ප්‍රාථමික මට්ටම | 92 | 82 | 10 |
| | 1134 | 827 | 307 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 හි මුළු පුරප්පාඩු සංඛ්‍යාව 307 ක් වී තිබුණු අතර සංවර්ධන නිලධාරී තනතුරු 161 ක්ද, රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 28 ක්ද, ග්‍රාම නිලධාරී තනතුරු 52 ක්ද, ප්‍රධාන වශයෙන් පුරප්පාඩු වී පැවැතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් 8 දෙනෙකු, අනුමත තනතුරු සංඛ්‍යාවට ඇතුළත් කර තිබුණද, කිසිදු කාර්යාලයක එම තනතුරු සඳහා බඳවාගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඈ) වැලිකන්ද, ඇලහැර, ලංකාපුර මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පරිපාලන නිලධාරී තනතුරු පුරප්පාඩුව පවතින අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ පුරප්පාඩු 5 ක්ද පිරවීමට අවධානය යොමුවී නොතිබුණි. වසරකට අධික කාලයක සිට පුරප්පාඩුව පවතින එම තනතුරු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති විශාල වශයෙන් සිදුවන කාල පරිච්ජේදයක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 සඳහා කාර්මික නිලධාරී තනතුරු 14 ක් අනුමත සේවක සංඛ්‍යාවේ පවතින නමුත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 ක පුරප්පාඩු 6 ක් පවතින බව නිරීක්ෂණය වු අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඉහළ කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කර නොතිබුණි.

(ඉ) පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා අනුමත ප්‍රාදේශීය ලේකම් තනතුරු සංඛ්‍යාව 7 ක් වූ අතර ඉන් තනතුරු 3 ක් පුරප්පාඩු වී තිබීම මත රාජකාරී ඉටුකිරීමේ පත්වීම් වසරකට අධික කාලයක සිට ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.2 වගන්තිය කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඊ) වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අඛණ්ඩ සේවා කාලය අවුරුදු 05 ඉක්මවූ නිලධාරීන් 10 ක්ද, හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 11 ක්ද, ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 34 දෙනෙකු ද, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 30දෙනෙකු ද ස්ථාන මාරු කිරීමකින් තොරව සේවයේ යොදවා තිබුණි.

## 2.20 රජයේ නිලධාරීන් ඇප තැබීම

රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටිම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරිම, හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවැරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් මැදිරිගිරිය හා තමන්කඩුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි.

## 2.21 තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සුදානම් වීම

(අ) 2018 වර්ෂයේ අයවැය සකස් කිරීමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජුලි 31 දිනැති අංක BD/CBD/4/1/2-2018 දරන චක්‍රලේඛයේ හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති උපායමාර්ග 03 පදනම් කරගෙන ඇති බවට තහවුරු නොවුණි.

(ආ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශව වෙත පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් මොනවාද යන්න තහවුරු නොවුණි.

(ඇ) අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කර තිබුණද යොදවා ඇති නිලධාරීන්ට අවශ්‍ය භෞතික පහසුකම් ප්‍රමාණවත් පරිදි සපයා නොතිබුණි.